ආර්ථික විද්‍යාව

4.5 පූර්ණ තරගකාරී ආයතනයක් සහ කර්මාන්තය කෙටි කාලයේදී හැසිරෙන ආකාරය විමසා බලයි

ඉගෙනුම් පල:

පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය හා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය වෙන් වෙන්ව හඳුන්වයි.

ආයතනයක ඉල්ලුම් වක්‍රය හා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය අතර සම්බන්ධතාව ප්‍රස්ථාර ඇසුරෙන් පැහැදිලි කරයි.

ආයතනයක් ලාභ උපරිම කිරීමේ මූලික ප්‍රවේශ නම් කරයි.

මුළු අයභාරය -මුළු පිරිවැය ප්‍රවේශය සංඛ්‍යා ලේඛන හා ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කරයි.

ආන්තික අයභාරය - ආන්තික පිරිවැය ප්‍රවේශය සංඛ්‍යා ලේඛන හා ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කරයි.

පූර්ණ තරගකරී ආයතනයක කෙටි කාලයේ හැසිරීම සංඛ්‍යා ලේඛන හා ප්‍රස්තාර ඇසුරෙන් විග්‍රහ කරයි.

පූර්ණ තරගකාරී ආයතනයක ප්‍රාමාණික ලාභ, නිෂ්ප්‍රාමණික, අවප්‍රාමාණික ලාභ සහ ආයතනයක නිෂ්පාදනය අත්හිටුවීම යන සංකල්ප ප්‍රස්තාර ඇසුරෙන් පැහැදිලි කරයි

ආයතනයක කෙටි කාලීන සැපයුම් වක්‍රයේ හැසිරීම ප්‍රස්තාර සටහන් ඇසුරෙන් විග්‍රහ කරයි.

වෙළෙඳපොළ සැපයුම් වක්‍රය හා ඉල්ලුම් වක්‍රය මගින් කමර්ාන්තයේ සමතුලිතය ප්‍රස්තාර සටහන් ඇසුරෙන් විග්‍රහ කරයි



අන්තගර්තය -E.M.M.S.D ගෝමස් මිය / W.M.M වීරසිංහ මිය බප/ජය/ ධම්ර්පාල විද්‍යාලය
සැකසුම - ප්‍රදීප් මාධව එදිරිමුණි කු/ ශ්‍රී නිශ්ශංක ජාතික පාසල
අන්තගර්තය පරීක්ෂා කිරීම : W. E. M. D. ලලිත් සමන්ත විජේසිංහ මයා - විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය හොරණ.
The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය හා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය

පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් සමජාතීය භාණ්ඩ නිපදවීම හා මුළු වෙළෙඳපොළ සැපයුමෙන් ඉතා සුළු කොටසක් සපයන නිසා, මිල ගනුවනු ලෙස සැලකෙන අතර පවතින මිලට ඕනෑම ප්‍රමාණයක් අලෙවි කරගත හැකි නිසා ආයතනයේ ඉල්ලුම් වක්‍රය තිරස් අක්ෂයට සමාන්තර වූ සරල රේඛාවක පිහිටයි.



ආයතනයේ ඉල්ලුම් වක්‍රය

ආයතනය මිල ගනුවනු වුවද, කමර්ාන්තයට භාණ්ඩයක මිල තීරණය කළ හැකි නිසා එහි ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.



පූර්ණ තරගකාරී කමර්ාන්තයේ ඉල්ලුම් වක්‍රය

අන්තගර්තය -E.M.M.S.D ගෝමස් මිය / W.M.M වීරසිංහ මිය බප/ජය/ ධම්පාල විද්‍යාලය
සැකසුම - ප්‍රදීප් මාධව එදිරිමුණි කු/ ශ්‍රී නිශ්ශංක ජාතික පාසල
අන්තගර්තය පරීක්ෂා කිරීම : W. E. M. D. ලලිත් සමන්ත විජේසිංහ මයා - විද්‍යාරත්න විශ්ව විද්‍යා පීඨය හොරණ.
The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ආයතනයේ ඉල්ලුම් වක්‍රය හා කමර්ාන්තයේ ඉල්ලුම් වක්‍රය අතර සබඳතාව පහත පරිදි දැක්විය හැක.



කමර්ාන්තයේ ඉල්ලුම්(D_M) සහ සැපයුම්(S_M) වක්‍රය

ආයතනයේ ඉල්ලුම් වක්‍රය

කමර්ාන්තයේ තීරණය වී ඇති සමතුලිත මිල P_0 වන අතර ආයතන වල නිෂ්පාදිතය මෙම P_0 මිලට අලෙවි කරගත හැකිය. ආයතනය මුහුණදෙන මිල වෙනස් වන්නේ කමර්ාන්තයේ ඉල්ලුම හෝ සැපයුම වෙනස් වුවහොත් පමණි.

උදා:- කමර්ාන්තයේ සැපයුම ස්ථාවර ව තිබියදී ඉල්ලුම වැඩි වුවහොත් සමතුලිත මිල ඉහළ යන අතර ආයතනවලට ලැබෙන මිල ද ඉහළ යයි. වෙළෙඳපොළ ඉල්ලුම ස්ථාවරව තිබියදී කමර්ාන්තයේ සැපයුම අඩු වුවහොත් සමතුලිත මිල පහළ යන අතර ආයතන වලට ලැබෙන මිල ද පහළ යයි.

පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේදී සංරෝධක දෙකකට මුහුණ දෙයි.

1. මිල ගනුවකු ලෙස කටයුතු කිරීමට සිදුවීම.
2. ආයතනය සතුව පවතින තාක්ෂණය හා ධාරිතාවය මත කටයුතු කිරීමට සිදු වීම.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ඒ අනුව මෙම සංරෝධක යටතේ කටයුතු කිරිමේ දී වැදගත් තීරණ දෙකක් ගැනීමට ආයතනයට සිදු වේ.

1. නිෂ්පාදනයේ තවදුරටත් රැඳී සිටිනවාද නැතිනම් ආයතනය වසා දමනවා ද?
2. තවදුරටත් නිෂ්පාදනයේ යෙදෙනවා නම් කොපමණ භාණ්ඩ ප්‍රමාණයක් නිපදවනවාද?

තවදුරටත් නිෂ්පාදනයේ රැඳී සිටීමට තීරණය කළේ නම් ආයතනයට සිය ප්‍රශස්ත නිමැවුම තීරණය කිරීමට අනුගමනය කළ හැකි විකල්ප ප්‍රවේශ දෙකකි.

1. මුළු අයභාරය (TR) - මුළු පිරිවැය (TC) ප්‍රවේශය
2. ආන්තික අයභාරය (MR) - ආන්තික පිරිවැය (MC) ප්‍රවේශය

මුළු අයභාරය (TR) - මුළු පිරිවැය (TC) ප්‍රවේශය.

- ආයතනයේ මුලු අයභාරය හෙවත් අලෙවි ආදායම භාණ්ඩයේ මිල එම ප්‍රමාණයෙන් ගුණ කිරීමෙන් ලබාගත හැක.

මුළු අයභාරය= මිල×ප්‍රමාණය

$$TR = P \times Q$$

- එහි පිරිවැය, මුළු ස්ථාවර පිරිවැය හා මුළු විචල්‍ය පිරිවැයෙහි එකතුවෙන් ගණනය කළ හැකිය.

මුළු පිරිවැය=මුළු ස්ථාවර පිරිවැය +මුළු විචල්‍ය පිරිවැය

$$TC = TFC + TVC$$

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

නිමැවුම (දිනකට ඒකක) (Q)	මුළු අයභාරය (රුපියල්) (TR)	මුළු පිරිවැය (රුපියල්) (TC)	ආර්ථික ලාභය (රුපියල්) (TR –TC)
0	0	20	-20
1	20	36.8	-16.8
2	40	52.8	-12.8
3	60	68.0	-8.0
4	80	80.0	0
5	100	90.4	9.6
6	120	101.6	18.4
7	140	114.4	25.6
8	160	128.0	32.0
9	180	146.4	33.6
10	200	168.0	32.0
11	220	196.0	24.0
12	240	240.0	0

❖ භාණ්ඩ ඒකකයක මිල රු 20.00 ලෙස සැලකිල්ලට ගෙන ඇත.

උපරිම ආර්ථික ලාභය = මුළු අයභාරය-මුළු පිරිවැය

33.60 = 180 -146.40

උපරිම ආර්ථික ලාභය ගෙනදෙන නිමැවුම් මට්ටම ඒකක 09 කි. එය ප්‍රශස්ත නිමැවුම් මට්ටම ලෙස හැඳින්වේ.

ඉහත තොරතුරු පුස්තාරිකව නිරූපනය කළ හැක

TR/TC (රු)

TC

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk



ඉහත ප්‍රස්තාර සටහන අනුව A,B ලක්ෂයන් හිදී මුළු අයභාර (TR) වක්‍රය, මුළු පිරිවැය වක්‍රය (TC)ඡේදනය වේ. ඒඅනුව A හා B ලක්ෂයන් හිදී ආර්ථික ලාභය ශූන්‍ය වේ. A ලක්ෂ්‍යයට පහළ කොටසේ දී මුළු අයභාර වක්‍රය ට (TR) වඩා ඉහළින් මුළු පිරිවැය වක්‍රය (TC) ගමන් කරන නිසා ආර්ථික ලාභය සෘණ අගයක් ගනී. එසේම B ලක්ෂ්‍යයට ඉහළ කොටසේ දී මුළු අයභාර වක්‍රයට වඩා ඉහළින් මුළු පිරිවැය වක්‍රය (TC) ගමන් කරන නිසා ආර්ථික ලාභ සෘණ වේ. A හා B අතර ප්‍රදේශයේ දී මුළු අයභාර වක්‍රය (TR) මුළු පිරිවැය වක්‍රය ට(TC) ඉහළින් ගමන්කරන නිසා A, B අතර ප්‍රදේශය ආර්ථික ලාභ සහිත වේ.

ඒ අනුව පූර්ණ තරගකාරී ආයතනයක් උපරිම ආර්ථික ලාභ පවතින අවස්ථාව ප්‍රශස්ත නිමැවුම් මට්ටම වශයෙන් තෝරා ගන්නා නිසා එය MN ලම්බක දුරින් දැක්වෙන අතර ලැබෙන ආර්ථික ලාභය රු 33.60 ලෙස දැක්වේ. ඒ අනුව කෙටි කාලයේදී ප්‍රශස්ත නිමවුම් මට්ටම ලෙස ඒකක 09 තෝරාගනී.

Copyright © e-thaksalawa.moe.gov.lk

ආන්තික අයභාරය (MR) ආන්තික පිරිවැය (MC) ප්‍රවේශය (ආන්තික විශ්ලේෂණය)

පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් ආන්තික අයභාරය (MR) ආන්තික පිරිවැයට(MC) සමාන වන අවස්ථාවේදී ද ප්‍රශස්ත නිමැවුම තෝරාගනී. නිමැවුම අතිරේක ඒකකයකින් වැඩි කරන විට ආයතනයේ මුළු අයභාරයට අලුතෙන් එකතු වන ප්‍රමාණය ආන්තික අයභාරය යි. මුළු අයභාරයේ වෙනස නිමැවුමේ වෙනසින් බෙදීමෙන් ආන්තික අයභාරය ගණනය කළ හැකිය.

$$\text{ආන්තික අයභාරය} = \frac{\text{මුළු අයභාරයේ වෙනස}}{\text{නිමැවුමේ වෙනස}}$$

$$MR = \frac{\Delta TR}{\Delta Q}$$

නිමවුම(Q) ඒකක	**මුළු අයභාරය (රු)TR**
10 > 2 **12**	100 > 100 200

$\Delta TR = 100$

$\Delta Q = 2$

MR = 100/2

= රුපියල් 50.00

නිමවුම අතිරේක ඒකකයකින් වැඩි කිරීමේ දී මුළු පිරිවැයට අලුතෙන් එකතු වන ප්‍රමාණය ආන්තික පිරිවැය යි.

$$\text{ආන්තික පිරිවැය} = \frac{\text{මුළු පිරිවැය වෙනස}}{\text{නිමවුමේ වෙනස}} \qquad MC = \frac{\Delta TC}{\Delta Q}$$

නිමවුම(Q) ඒකක	මුළු පිරිවැය (TC)
20 > 10 30	300 > 200 500



ΔTC

$\Delta TC = 200$

$\Delta Q = 10$

Copyright © e-thaksalawa.moe.gov.lk

$$MC = \frac{}{\Delta Q}$$

$$MC = \frac{200}{10}$$

MC = රු 20.00

පූර්ණ තරගකාරී ආයතනයක් පැවරුණු මිලක් යටතේ කටයුතු කරන නිසා ආයතනයේ මිල (P) සාමාන්‍ය අයභාරයට (AR) හා ආන්තික අයභාරයට (MR) සමාන වේ. (P = AR = MR)

ප්‍රමාණය (Q)	මිල(P)	මුළු අයභාරය(TR)	සාමාන්‍ය අයභාරය(AR)	ආන්තික අයභාරයට(MR)
0	10	0	0	-
1	10	10	10	10
2	10	20	10	10
3	10	30	10	10
4	10	40	10	10
5	10	50	10	10

භාණ්ඩයේ මිල රු 10 වන්නේ යැයි උපකල්පනය කර ඇත.

ඉහත තොරතුරු ප්‍රස්තාරිකව දැක්වූ විට P = AR = MR =D වන බව පහත පරිදි දැක්විය හැකිය



කෙටි කාලයේ දී පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් MR = MC කොන්දේසිය යටතේ ප්‍රශස්ත නිමැවුම තෝරාගන්නා ආකාරය පහත සටහන නිරූපණය කරයි.

නිමවුම (Q)	මුළු අයභාරය (TR)	මුළු පිරිවැය (TC)	ආන්තිකඅයභාරය(MR)	ආන්තික පිරිවැය (MC)	ආර්ථික ලාභය (TR -

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

					TC)
6	120	101.6	20	12.8	18.4
7	140	114.4	20	13.6	25.6
ඞ8	160	128.0	20	18.4	32.0
9	180	146.4	20	21.6	33.6
10	200	168.0	20	28.0	32.0
11	220	196			24.0

සංඛ්‍යා සටහනට අනුව ආන්තික අයභාරය, සෑම නිමැවුමකදී ම රු. 20 කි. ආන්තික පිරිවැය රු. 20ක් වන්නේ නිමැවුම් ඒකක 8ත් 9ත් අතරදීය. එබැවින් MR = MC වන්නේ ඒකක 9දීය. එබැවින් උපරිම ලාභ ගෙන දෙන නිමැවුම් මට්ටම ඒකක 9ක් වේ. පහත ප්‍රස්තාරයෙන් ද එය දැක්විය හැක.



A ලක්ෂ්‍යයේදී MR= MC වේ. ආර්ථික ලාභද උපරිම වන ප්‍රශස්ත නිමවුම් ඒකක 9 වේ. K ලක්ෂ්‍යයේදී MR = MC වුවද එය ප්‍රශස්ත නිමවුම සේ තෝරා නොගනී. එයට හේතුව MC වක්‍රය MR වක්‍රය ඡේදනය කළ යුත්තේ MC වක්‍රය ඉහළ සිට පහළට ගමන් කරන විට නොව පහළට සිට ඉහළට ගමන් කරන විටයි. එනම් MC වක්‍රයේ බෑවුම ධන අගයක් ගන්නා විටයි. එයට හේතුව වන්නේ K ලක්ෂ්‍යයේදී පවතින නිමැවුම් මට්ටමෙන් ඉදිරියට නිෂ්පාදනය ප්‍රසාරණය කරන විට ආන්තික අයභාරය, ආන්තික පිරිවැයට වඩා වැඩි වන හෙයින් (MC < MR) ආර්ථික ලාභයට එකතුවක් සිදුවේ. එබැවින් උපරිම ආර්ථික ලාභ ලබන්නේ A ලක්ෂ්‍යය දක්වා නිමැවුම වැඩි කළ විටයි.

පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතන කෙටි කාලය තුළ මුහුණ දෙන අවස්ථා

- ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටීම (නිෂ්ප්‍රාමාණික ලාභ / අති ප්‍රාමාණික ලාභ)
- ආර්ථික ලාභ ශූන්‍ය මට්ටමේ නිෂ්පාදනයේ යෙදීම (ප්‍රාමාණික ලාභ)

ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටීම (නිෂ්ප්‍රාමාණික ලාභ)

පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් ආර්ථික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටින අවස්ථාවේදී මිල (P) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) ඉක්මවා යන අතර මුළු අයභාරය (TR) මුළු පිරිවැය (TC) ඉක්මවා යයි.



ඉහත රූප සටහනට අනුව MR = MC කොන්දේසිය ඉටු වන්නේ A ලක්ෂ්‍යයේ දී වන අතර එයට අදාළ නිමවුම් මට්ටම ඒකක 09 ක් වේ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

ඉහත ප්‍රස්තාරයට අනුව ආර්ථික ලාභය පහත පරිදි ගණනය කළ හැකිය.

මුළු අයභාරය = සාමාන්‍ය අයභාරය X නිමවුම්ඒකක ප්‍රමාණය	මුළු පිරිවැය = සාමාන්‍ය පිරිවැය X නිමවුම් ඒකක ප්‍රමාණය
TR = AR X Q	TC = ATC X Q
180 = 20 X 9	108 = 12 X 9
ආර්ථික ලාභ =	TR – TC
=	180 – 108
=	රු 72

ආර්ථික ලාභය පහත පරිදි ද ගණනය කළ හැකිය.

නිමැවුම් ඒකකයක මිල	= රු. 20
නිමැවුම් ඒකකයක සාමාන්‍ය පිරිවැය	= රු. 12
නිමැවුම් ඒකකයක ලාභය	= රු. 20 - රු. 12
	= රු 8
ලාභ උපරිම වන නිමැවුම් ප්‍රමාණය	= ඒකක 9
ආර්ථික ලාභය	= ඒකක ලාභය × නිමැවුම් ප්‍රමාණය
	= 8 × 9
	= රු 72

ආර්ථික ලාභ ශුන්‍ය මට්ටමේ නිෂ්පාදනයේ යෙදීම (ප්‍රාමාණික ලාභ)

පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක් මිල සාමාන්‍ය පිරිවැයට සමාන වන හා මුළු අයභාරය මුළු පිරිවැයට සමාන වන අවස්ථාවේ ප්‍රාමාණික ලාභ උපයමින් නිෂ්පාදනයේ යෙදී සිටියි.



Copyright © e-thaksalawa.moe.gov.lk

රූප සටහනේ A ලක්ෂ්‍යයෙන් සමතුලිත අවස්ථාව දැක්වේ. ඊට අදාළ නිමැවුම් ඒකක 08 කි.

ඉහත ප්‍රස්තාරයට අනුව ආර්ථික ලාභය පහත පරිදි දැක්විය හැකිය
ආර්ථික ලාභය පහත පරිදි ද ගණනය කළ හැකිය.

මුළු අයභාරය = සාමාන්‍ය අයභාරය × නිමැවුම (ඒකක)

TR = AR × Q

144 = 18 × 8

මුළු පිරිවැය = සාමාන්‍ය පිරිවැය×නිමවුම ඒකක

TC = ATC × Q

144 = 18 × 8

ආර්ථික ලාභ = TR – TC

= 144 - 144

= 0

ආර්ථික ලාභය පහත පරිදි ද ගණනය කළ හැකිය.

නිමැවුම් ඒකකයක මිල	= රු. 18
නිමැවුම් ඒකකයක සාමාන්‍ය පිරිවැය	= රු. 18
නිමැවුම් ඒකකයක ලාභය	= රු. 18 - රු. 18
	= රු 0
ලාභ උපරිම වන නිමැවුම් ප්‍රමාණය	= ඒකක 8
ආර්ථික ලාභය	= ඒකක ලාභය × නිමැවුම් ප්‍රමාණය
	= 0 × 8
	= රු 0

පාඩු ලැබීම (අවප්‍රාමාණික ලාභ)

Copyright © e-thaksalawa.moe.gov.lk

පූර්ණ තරගකාරී ආයතනයක භාණ්ඩ ඒකකයක සාමාන්‍ය පිරිවැය භාණ්ඩ ඒකකයක මිල ඉක්මවා යන අවස්ථාවේදී පාඩු ලැබීම සිදුවේ.



ඒ අනුව ආර්ථික අලාභ පහත පරිදි ද ගණනය කළ හැකිය.

මුළු අයභාරය = සාමාන්‍ය අයභාරය × නිමැවුම (ඒකක)

TR =	AR	×	Q
105 =	15	×	7

මුළු පිරිවැය = සාමාන්‍ය පිරිවැය×නිමවුම ඒකක

TC =	ATC	×	Q
175 =	25	×	7

ආර්ථික ලාභ = TR – TC

= 105 - 175

= <u>-70</u>

පූර්ණ තරගකාරී ආයතනයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය

ඉහත තොරතුරු අනුව කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක් නිෂ්පාදනයේ රැඳී සිටිනවාද නිෂ්පාදනය අත්හිටුවනවා ද යන්න තීරණය කෙරෙන තීරණාත්මක ලක්ෂ්‍යය වන්නේ මිල (p) අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට (AVC) සමාන වන ලක්ෂ්‍යයයි.

Copyright © e-thaksalawa.moe.gov.lk



A_0 ලක්ෂ්‍යයේදී මිල අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වන නිසා A_0 ලක්ෂ්‍යයෙන් ඉහළ පිහිටි MC වක්‍රය ආයතනයේ කෙටිකාලීන සැපයුම් වක්‍රයයි (S).එක් එක් මිලට සැපයීමට කැමති ප්‍රමාණය මෙයින් දක්වයි. භාණ්ඩයේ මිල(P) අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන විට නිෂ්පාදනය සිදු නොවේ. එහෙයින් පූර්ණ තරගකාරී ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය වන්නේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය (MC) වක්‍රයේ කොටසයි.



කමර්ාන්තයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය

පූර්ණ තරගකාරී වෙළෙඳපොළක කමර්ාන්තයේ ඉල්ලුම් වක්‍රය හා කමර්ාන්තයේ සැපයුම් වක්‍රය, ඡේදනය වන ලක්ෂ්‍යයේදී සමතුලිතතාව ඇතිවේ. පූර්ණ තරඟකාරී කමර්ාන්තයේ ඉල්ලුම් වක්‍රය භාණ්ඩය සඳහා අදාල

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

වෙළෙඳපොළේ සියලුම පෞද්ගලික ඉල්ලුම් වක්‍ර තිරස් අතට එකතු කිරීමෙන් ලබාගන්නා අතර එය වමේ සිට දකුණට පහළට බෑවුම් වේ.

එසේම පූර්ණ තරගකාරී වෙළෙඳපොළ සැපයුම් වක්‍රය ලබාගන්නේ ආයතනවල සැපයුම් වක්‍ර වල තිරස් එකතුවෙන් හෝ ආයතන සියල්ලේම අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍ර වල තිරස් එකතුවෙනි

මිල (රු)	එක් ආයතනයක සැපයුම (ඒකක)	වෙළෙඳපොළ සැපයුම (ඒකක)
15	12	1200
20	13	1300
25	14	1400

වෙළෙඳපොළේ ආයතන 100ක් ඇතැයි උපකල්පනය කර වෙළෙඳපොළේ සැපයුම ගණනය කර ඇත.

ඉහත තොරතුරුවලට අදාල වෙළෙඳපොළ සැපයුම් වක්‍රය පහත පරිදි වේ.



කර්මාන්තයේ කෙටිකාලීන සමතුලිතතාවය

ඉහත තොරතුරු අනුව පූර්ණ තරගකාරී වෙළෙඳපොළක මිල තීරණය වන්නේ කර්මාන්තය තුළ සිටින සියලුම විකුණුම්කරුවන්ගේ හා ගැනුම්කරුවන්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය තුලිනි. ගැනුම්කරුවන්ගේ හැසිරීම ඉල්ලුම් වක්‍රය තුලින්ද විකුණුම්කරුවන්ගේ හැසිරීම සැපයුම් වක්‍රය තුලින් ද නිරූපණය වේ.

මිල (රු)



කමර්ාන්තයේ ඉල්ලුම් වක්‍රය (D_M)හා කමර්ාන්තයේ සැපයුම් වක්‍රය (S_M)එකිනෙක ඡේදනය වීමෙන් වෙළෙඳපොළ සමතුලිතය තීරණය වන අතර ඉහත රූප සටහනට අනුව එලෙස තීරණය වූ සමතුලිත මිල රු 20 වන අතර සමතුලිත ප්‍රමාණය ඒකක 1 300 වේ.

The National e-learning Portal for the General Education
Copyright © e-thaksalawa.moe.gov.lk